**<u>සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය</u>**

**<u>ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණයේ</u>**

**<u>පුරප්පාඩු සඳහා බඳවා ගැනීම</u>**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණය (PL-01-2006A)

### 1.1. අධ්‍යාපන සුදුසුකම් -

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.

### 1.2. කායික සුදුසුකම් -

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

### 1.3. වැටුප් ක්‍රමය - PL 1 - 2006A

රු.11,730 - 10x120 - 10 x 130 - 10 x 145 - 12 x 160 – 17600 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවරට බඳවා ගනු ලැබේ

.

**1.4. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි -**

මෙම තනතුර ස්ථිරය. පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. බඳවා ගනු ලබන සියළුම අයදුම්කරුවන් වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**1.5 බඳවා ගැනීමේ ක්‍රමය -**

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය මත බඳවා ගනු ලැබේ.

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ |
|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් |
| 2. පලපුරුද්ද |
| 3. ක්ෂේත්‍රයට අදාලව රජය පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා හා ලබා ඇති පුහුණුවීම් |
| 4. ක්‍රීඩා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී පිළිඹිබු කරන ආකල්ප හා පෞරුෂය සඳහා |

**1.6. වෙනත් සුදුසුකම්**

(අ.) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ආ.) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ.) 2015.06.20 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

(ඇ.) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**1.7.** **තනතුරු පුරප්පාඩු**

1.7.1. කෞතුකාගාර මුරකරු - පුරප්පාඩු 10

1.7.2 කෞතුකාගාර සහායක - පුරප්පාඩු 44

**1.8.** **අයදුම්පත් එවිය යුතු ආකාරය -**

- මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කරවාගත් අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

  අංක 01 සිට 09 දක්වා වන ශීර්ෂ 01 වන පිටුවටද අංක 10 සිට 12 දක්වා වන ශීර්ෂ 02 වන පිටුවටද අංක 13 සිට 15 දක්වා වන ශීර්ෂ 03 වන පිටුවටද වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුය.

- නියමිත ආකෘතියට අනුකූලව සැකසූ අයදුම්පත් 2015.06.20 දින හෝ එදිනට පෙර ලැබෙනසේ අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, තැ.පෙ. 854, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- නියමිත ආකෘතියට සකස් නොකල නිසියාකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

- අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කෞතුකාගාර සහායක /කෞතුකාගාර මුරකරු තනතුරු සඳහා බඳවා ගැනීම" යනුවෙන් අදාල පරිදි සදහන් කළ යුතුය.

- ඉල්ලුම් කරන තනතුරට වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

- දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

**1.9.** **අත්සන සහතික කරවා ගැනිම :-**

දැනටමත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවකු තම අත්සන තමා සේවය කරන ආයතන ප්‍රධානියා ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු / විශ්‍රාමික ප්‍රධානියෙකු / කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයෙකු , සමාදාන විනිශ්චයකාරවරයෙකු , දිවුරුම් කොමසාරිස්වරයෙකු ,නීතිඥවරයෙකු , ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 240,360/= හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්නාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**1.10.** **වෙනත් -** මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණක් පිළිබඳව සහ බඳවා ගැනීම් සම්බන්ධව කෞතුකාගාර අධ්‍යක්ෂගේ තීරණය අවසාන තීරණය වේ.

අධ්‍යක්ෂ

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,

අංක 854, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,

කොළඹ 07.

## ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව "කෞතුකාගාර සහායක / මුරකරු"**

**තනතුර සඳහා අයදුම්පත්‍රය**

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**

| |
|---|
| |

**01.** අයදුම්කරුගේ නම

**1.1**මුලකුරු සමග නම

I. සිංහලෙන්/දෙමළෙන්:-…………………………………………………………………..

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS):-

……………………………………………………………………………..………

**1.2**මුලකුරුවලින් හැඳින්වෙන නම්:

I. සිංහලෙන්/දෙමළෙන්:-…………………………………………………………………..

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS)

……………………………………………………………………………..………

**02.** ලිපිනය

I.පෞද්ගලික ලිපිනය :-.........................................................................................

..........................................................................................................................

II.දිස්ත්‍රික්කය :-......................................

III.රාජකාරි ලිපිනය (රැකියාවක් කරන්නේ නම්):-..............................................................

**03.** දුරකථන අංකය පෞද්ගලික:-................................ රාජකාරි:-.........................................

**04.** උපන් දිනය :-……………………………………………..

2015.06.20 දිනට වයස **:-** අවු:-……………. මාස:-…………… දින:-………......

**05.**ජාතික හැඳුනුම්පත් අංකය :-……………………………………

**06.**ස්ත්‍රී/පුරුෂ භාවය :-...............................

**07.**විවාහක/අවිවාහක බව :-..............................

**08.** ජන වර්ගය :- ..............................

**09.** පුරවැසිභාවය :- පරම්පරාවෙන් / ලියාපදිංචි වීමෙන්

**10.** **අධ්‍යාපන සුදුසුකම්:**

**I අ.පො.ස (සා./පෙළ) විභාගය**:-පළමුවර / දෙවනවර

විභාග අංකය........................ වර්ෂය............................ මාධ්‍යය...........................

**විෂයය** **ශ්‍රේණිය**

(1).................................................... .........................................

(2).................................................... .........................................

(3).................................................... .........................................

(4).................................................... .........................................

(5)................................................... .........................................

(6)................................................... .........................................

(7).................................................. .........................................

(8)................................................. .........................................

සැ.යු. සහතික වල පිටපත් අමුණා එවිය යුතුය.

**<u>11.වෘත්තීය දැනුම හා කුසලතාවයන් පිළිබඳ විස්තර</u>**

| පාඨමාලාව | ආයතනය | විෂයයන් | ප්‍රතිඵල |
|---|---|---|---|
| | | | |

සැ.යු. සහතික වල පිටපත් අමුණා එවිය යුතුය.

**<u>12.පළපුරුද්ද පිළිබඳ විස්තර:-</u>**

| තනතුර | ආයතනය | සේවයේ නියුක්තව සිටි කාලය |
|---|---|---|
| | | |

සැ.යු. සේවා සහතික මගින් සනාථ කළ යුතුය.

**13.දැනට රජයේ යම්කිසි තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර:-**

1. තනතුර හා ශ්‍රේණිය:-......................................................................
2. පත් වූ දිනය:-..............................................................................
3. ආයතනය:-..................................................................................
4. විශ්‍රාම වැටුප් සහිත තනතුරක්ද යන වග :-…………………………...

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් , පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි .

................................................ ................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ................................................................ නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

.......................................... .........................................................

දිනය සහතික කරන්නාගේ අත්සන

සහතික සහතික කරන්නාගේ නම:-....................................................

තනතුර :-....................................................

ලිපිනය :-....................................................

නිල මුද්‍රාව:-................................................

**15. රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

........................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

.......................................... .........................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව